# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018 අගෝස්තු

අ.පො.ස.(උ.පෙළ) විභාගය 2018 අගෝස්තු 06 දින ආරම්භ කර සැප්තැම්බර් 01 වන දින තෙක් පැවැත්වෙන බව මෙයින් නිවේදනය කෙරේ.

මෙම විභාගය සඳහා පෙනී සිටින පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් අදාළ පාසල් ප්‍රධානීන් වෙත ද, පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයට ද තැපැල් කර ඇත. පාසල් ප්‍රධානීන් වෙත එවා ඇති පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර ඔවුන් වෙත නොපමාව බෙදා දිය යුතු ය. කිසිදු හේතුවක් මත පමා නොකළ යුතු ය.

මේ වන විටත් ප්‍රවේශපත්‍ර නොලත් පෞද්ගලික අයදුම්කරුවන් වෙතොත් තමා ඉදිරිපත් කළ ඉල්ලුම්පතේ පිටපතක්, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබා ගත් සහතික කළ ලිපියක් සහ අයදුම්පත්‍රය ලියා පදිංචි තැපෑලට යොමු කළ කුවිතාන්සිය සමඟ මෙම දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන ශාඛාවට ලිඛිතව දැන්විය යුතු ය, නැතහොත් පැමිණ විමසිය යුතු ය.

ප්‍රවේශ පත්‍ර ලද නමුත් විෂය සංශෝධනයක්, මාධ්‍ය සංශෝධනයක් හෝ වෙනත් සංශෝධනයක් අවශ්‍ය පෞද්ගලික අයදුම්කරුවන් සෘජුව ම විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන ශාඛාවට පැමිණ හෝ පහත සඳහන් දුරකථන අංකවලට හෝ ෆැක්ස් අංකයට 2018 ජූලි 20 වන දිනට පෙර දැනුම් දිය යුතු ය.

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ මෙම විභාගය සඳහා පිළිගත් හැඳුනුම්පතක් වශයෙන් සැලකේ.

**මෙම වසරේ සිට පැය තුනක කාලයක් ඇති ප්‍රශ්න පත්‍ර සඳහා ප්‍රශ්න පත්‍රය කියවීම හා ප්‍රශ්න තෝරා ගැනීම සඳහා විනාඩි 10ක අතිරේක කාලයක් ලබා දීමට කටයුතු සිදු කොට ඇත.**

1. අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයකු විභාගයට පෙනී සිටීම, සටහන් ළඟ තබාගෙන පිළිතුරු සැපයීම, වෙනත් අයදුම්කරුවකුගේ උදව් ලබාගැනීම, උදව් දීම හා විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
2. මෙම විභාගය සඳහා ගණක යන්ත්‍ර හා මකන දියර පාවිච්චි කිරීමට ඉඩදෙනු නොලැබේ.
3. දැනටත් කිසියම් රජයේ පාසලක ඉගෙනුම ලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.
4. විභාග ශාලාව තුළට ජංගම දුරකථන, ස්මාට් වොච් හෝ ඉලෙක්ට්‍රොනික උපාංග ගෙන ඒම සපුරා තහනම් වන අතර එසේ ගෙනවිත් අසුවුවහොත් වසර පහක විභාග තහනමකට ලක් වේ.

**විමසීම් :-**

දුරකථන අංක 011 - 2784208, 2784537,

ෆැක්ස් අංකය 011 - 2784422

තැපැල් ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ

**විභාග කාල සීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය**

**දුරකථන අංක ඃ 0112786200, 2784201, 2784204, 2786205, 2784206, 2787207, 2785202**

**ක්ෂණික ඇමතුම් අංකය ඃ 1911**

**බී. සනත් පූජිත**
**විභාග කොමසාරිස් ජනරාල්**

6/3/උ.පෙළ/2018
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල
2018.07.13 දින

U:\U . A\6.3\AL PEPAR AD.docx

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018 අගෝස්තු

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2009/16 අනුව විෂය ධාරා 6ක් ක්‍රියාත්මක වේ.

1. කලා විෂය ධාරාව
2. වානිජ්‍ය විෂය ධාරාව
3. ජෛවීය විද්‍යා විෂය ධාරාව
4. භෞතීය විද්‍යා විෂය ධාරාව
5. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව
6. ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව

02. 2009/16 චක්‍රලේඛයට අනුව ඉහත විෂය ධාරාවන්ට අනුගත නොවන වෙනත් විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවලදී අයදුම්කරුවන් නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන (OTH) යනුවෙන් හඳුන්වා දෙනු ලැබේ.

03. ඉහත නිශ්චිත විෂය ධාරාවක අයත් නොවන අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීමේදී දිවයින තරාව (Island Rank) හා දිස්ත්‍රික් තරාව (District Rank) නිකුත් කරනු නොලබනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**විමසීම් :-**

දුරකථන අංක 011 - 2784208, 2784537,

ෆැක්ස් අංකය 011 - 2784422

තැපැල් ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ

**විභාග කාල සීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය**

**දුරකථන අංක ඃ 0112786200, 2784201, 2784204, 2786205, 2784206, 2787207, 2785202**

**ක්ෂණික ඇමතුම් අංකය ඃ 1911**

**බී. සනත් පූජිත**
**විභාග කොමසාරිස් ජනරාල්**

6/3/උ.පෙළ/2018
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල
2018.07.13 දින

U:\U . A\6.3\AL PEPAR AD.docx